අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP)

ඇබෑර්තු

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම හා කර්තව්‍ය ඉටුකිරීම) පනත, මගින් ස්ථාපිත කරන ලද ස්වාධීන කොමිෂන් සභාවකි. පනතෙහි සඳහන් පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්යයන්ට පුළුල්ව ඇතුළත් වන්නේ, රටෙහි විවිධ වකවානුවලදී හටගත් සන්නද්ධ ගැටුම් හා දේශපාලනික නොසන්සුන් තාවයන් හේතුවෙන් හෝ අතුරුදන්ව සිටින තැනැත්තන් සම්බන්ධයෙන්, ඔවුන් සිටිනා තැනක් පිළිබඳව සොයාබැලීම, ඔවුන්ගේ ඥාතීන්ට සහන සැලසීමත් වේ. එසේම යළිත් එවන් සිද්ධීන් සිදු නොවනු සඳහා වන නිර්දේශයන් රජය වෙත ඉදිරිපත් කිරීමද එම කාර්යාලයට පැවරෙන වගකීමකි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

විධායක අධ්‍යක්ෂ — HM 1-3

රැකියා ස්වභාවය

සභාපතිවරයාගේ හා කොමසාරිස්වරුන්ගේ මග පෙන්වීම යටතේ OMP කාර්යාලයේ සමස්ත ක්‍රියාකාරීත්වය පිළිබඳ වගකීම දරනු ලබන අතර, ඒකකයන්හි ප්‍රධානීන්ගට රේඛීය කළමනාකරු වේ. එමෙන්ම, අදාළ අමාත්‍යාංශ / වෙනත් ආයතන සම්බන්ධීකරණයෙන් කටයුතු කළ යුතුය.

OMP කාර්යාලයේ උපායමාර්ගික සැලසුම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඔහු / ඇය වගකීම දරනු ඇත.

සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, පරිපාලන / කළමනාකරණ / නීතිය / ආර්ථික විද්‍යාව / සමාජීය විද්‍යාව / ව්‍යාපාර අධ්‍යයනය / රාජ්‍ය පරිපාලන / දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ / මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (CIMA/ACCA/ICA) ආශ්‍රිත සාමාජිකත්වය සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග වසර 03 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද සහිතව අවම වශයෙන් වසර 15 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

   හෝ

2. පිළිගත් වෘත්තීය ආයතනයක (CIMA/ACCA/ICA) පූර්ණ සාමාජිකත්වය සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 03 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද සමග කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

වයස : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්ගට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : රුපියල් 86,865-15X2,270 - 120,915/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 77,841/- (2019)

මෙම තනතුරට, නිල වාහනයක් සමග ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාළ දීමනා හිමි වේ.

මණ්ඩලීය ලේකම් / මූල්‍ය හා පරිපාලන ප්‍රධානී — HM 1-1

රැකියා ස්වභාවය

මණ්ඩලීය ලේකම්වරයෙක් කටයුතු කිරීම, වාර්ෂික අයවැය සකස් කිරීම, OMP කාර්යාලයෙහි සියලුම මූල්‍ය මෙහෙයුම් සහ මානව සම්පත් හා පරිපාලන කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සහ අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.

සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, පරිපාලන / මූල්‍ය / ගිණුම්කරණ / කළමනාකරණ / මානව සම්පත් කළමනාකරණ / රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම හෝ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක (CIMA/ACCA/ICA) ආශ්‍රිත සාමාජිකත්වය සමග සංස්ථාවක, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

   හෝ

2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (CIMA/ACCA/ICA) පූර්ණ සාමාජිකත්වය සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද

වයස : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්ගට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : රුපියල් 80,295-15X2,270 - 114,345/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 71,942/- (2019)

මෙම තනතුරට වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාළ දීමනා හිමිවේ.

නීති, ප්‍රතිපත්ති හා පර්යේෂණ අංග ප්‍රධානී — HM 1-1

රැකියා ස්වභාවය

ඒකකයේ කාර්යයන් අධීක්ෂණය ද ඇතුළත්ව, OMP කාර්යාලය සඳහා අවශ්‍ය නෛතික, ප්‍රතිපත්තිමය හා පර්යේෂණමය මැදිහත් වීම් සඳහා උපාය මාර්ග සැකසීම සඳහා නායකත්වය හා මාර්ගෝපදේශ ලබාදීම.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් හා නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

වයස : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්ගට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : රුපියල් 80,295-15X2,270 - 114,345/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 71,942/- (2019)

මෙම තනතුරට, වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාළ දීමනා හිමිවේ.

සන්නිවේදන හා සමාජ සම්බන්ධීකරණ අංග ප්‍රධානී — HM 1-1

රැකියා ස්වභාවය

OMP කාර්යාලය සඳහා අවශ්‍ය සමාජ බලපෑම් හා කැපවීම්, සන්නිවේදනය හා මාධ්‍ය මැදිහත්වීම් සඳහා උපායමාර්ග සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයන් සකස්කොට ක්‍රියාත්මක කිරීම.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ජන සන්නිවේදන / ජන මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

වයස : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්ගට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : රුපියල් 80,295-15X2,270 - 114,345/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 71,942/- (2019)

මෙම තනතුරට, වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාළ දීමනා හිමිවේ.

දත්ත කළමනාකරණ අංග ප්‍රධානී — HM 1-1

රැකියා ස්වභාවය

දත්ත පද්ධති සංවර්ධනය, පවත්වා ගෙනයාම හා අධීක්ෂණ කටයුතු සහ ඒකකය ස්ථාපිත කිරීම පිළිබඳ වගකීම දරනු ලබන අතර, OMP කාර්යාලයේ අවශ්‍යතා, පැවරුම්, රාජකාරී හා කාර්යයන් සඳහා ප්‍රතිචාර දක්විය යුතුය.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / සංඛ්‍යාණය සමග පරිගණක විද්‍යාව / තොරතුරු සන්නිවේදන තාක්ෂණය / පරිගණකකරණ හා තොරතුරු පද්ධති ක්ෂේත්‍රයෙහි ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ තලයේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

වයස : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල සේවයේ නියුතු අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : රුපියල් 80,295-15X2,270 - 114,345/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 71,942/- (2019)

මෙම තනතුරට, වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාළ දීමනා හිමිවේ.

රැකවරණ අංශ ප්‍රධානී — HM 1-1

රැකියා ස්වභාවය

ප්‍රාදේශීය කාර්යාලවල රැකවරණ ඒකක අධීක්ෂණය හා සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආශ්‍රිතව විධිමත් රැකවරණ ක්‍රමවේදයන් සහ අනුගමනය කළ යුතු පිළිවෙත් ඇතුළත්ව, වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා උපායමාර්ග සංවර්ධනය කිරීම පිළිබඳ වගකීම දරයි.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, නීතිය / සාමය හා ගැටුම් නිරාකරණය / දේශපාලන විද්‍යාව / සමාජීය විද්‍යාව යන ක්ෂේත්‍රවල ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ / මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

වයස : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ ස්ථිර තනතුරුවල දැනටමත් නියුතු අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : රුපියල් 80,295-15X2,270 - 114,345/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 71,942/- (2019)

මෙම තනතුරට, වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාළ දීමනා හිමිවේ.

සෙවීමේ ඒකක ප්‍රධානී — HM 1-1

රැකියා ස්වභාවය

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD.ALL RIGHTS RESERVED

සොදිස් කිරීම්, අධිකරණ වෛද්‍ය විමර්ශන, දත්ත කළමනාකරණ කටයුතු සඳහා තාක්ෂණ සහය ලබාදීමද ඇතුළත්ව සෙවීමේ හා විමර්ශන ඒකකයක් සැලසුම් කොට ස්ථාපිත කිරීම පිළිබඳ වගකීම දරනු ඇත. අදාළ ඒකකයන් සමග සමීප සහයෝගිතාවක් පවත්වාගත යුතුය.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, නීතිය / අපරාධවිද්‍යාව / සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ / මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

වයස : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : රුපියල් 80,295-15X2,270 - 114,345/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 71,942/- (2019)

මෙම තනතුරට, වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාළ දීමනා හිමිවේ.

වින්දිත හා පවුල් සහාය අංශ ප්‍රධානී — HM 1-1

රැකියා ස්වභාවය

ඒකකයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ අදාළ චාරිත්‍ර විධි සකස්කිරීම හා විශේෂඥයන් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයන් සකස්කොට සංවර්ධනය කිරීමද ඇතුළත්ව OMP ව්‍යාපෘතියෙහි මනෝ සමාජීය සහාය සහ ප්‍රජා සේවා ක්‍රියාකාරකම් සඳහා උපායමාර්ග සැලසුම් හා සමාලෝචන කටයුතුවල නායකත්වය දැරිය යුතුය.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මනෝ විද්‍යාව / උපදේශන හා මනෝවිද්‍යාව / දර්ශන විද්‍යාව හා මනෝ විද්‍යාව / සමාජීය විද්‍යාව / සාමය හා ගැටුම් නිරාකරණය යන ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

වයස : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියැලි අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : රුපියල් 80,295-15X2,270 - 114,345/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 71,942/- (2019)

මෙම තනතුර සඳහා, වාහන දීමනාවක් හා ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාළ දීමනා හිමිවේ.

පරිපාලන අංශ සහකාර ප්‍රධානී — MM 1-1

රැකියා ස්වභාවය

පරිපාලන කණ්ඩායමේ කොටස්කරුවකු වෙමින්, කාර්ය මණ්ඩලය සම්බන්ධීකරණය කරමින්. මානව සම්පත් හා පරිපාලන කටයුතු ආශ්‍රිත සියලු කරුණුවලදී විධායක අධ්‍යක්ෂ, මූල්‍ය හා පරිපාලන අංශ ප්‍රධානී සමග සම්බන්ධතාවයෙන් කටයුතු කිරීම.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, කළමනාකරණ / පරිපාලන / මානව සම්පත් කළමනාකරණ / රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයක උපාධියක් සමග අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එකක පශ්චාත් පළපුරුද්ද.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 53,175 - 10X1,375 - 15X1,910 - 95,575/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 47,668/- (2019)

මූල්‍ය හා ප්‍රසම්පාදන සහකාර ප්‍රධානී — MM 1-1

රැකියා ස්වභාවය

OMP කාර්යාලයේ සියලුම පද්ධති පවත්වා ගැනීම හා සියලුම මූල්‍ය ගනුදෙනු හා ප්‍රසම්පාදන කටයුතු පවත්වා ගෙනයාමත්, කාර්යක්ෂමව කළමනාකරණය කිරීමත් සඳහා මූල්‍ය හා පරිපාලන අංශ ප්‍රධානී විසින් පවරනු ලබන කාර්යයන් ඉටුකිරීම, ඒ පිළිබඳ වගකීම් දැරීම.

සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගිණුම්කරණ / මූල්‍ය / වාණිජ්‍ය ක්ෂේත්‍රයක උපාධියක් සමග තනතුරට අදාළ ක්ෂේත්‍රයක, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර එකක පළපුරුද්ද

   හෝ

2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (CIMA/ACCA/ICA) අන්තර් මධ්‍ය විභාගය සමත්වීම හෝ CMA පූර්ණ සුදුසුකම් සමග තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර එකක පළපුරුද්ද.

   හෝ

3. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) සමග තනතුරට අදාළ ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසුව, අවම වශයෙන් වසර එකක පළපුරුද්ද.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 53,175 - 10X1,375 - 15X1,910 - 95,575/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 47,668/- (2019)

ප්‍රාදේශීය සම්බන්ධීකාරක — MM 1-1

රැකියා ස්වභාවය

නායකත්වය හා මාර්ගෝපදේශ ලබාදෙමින්, ප්‍රාදේශීය කාර්යාල බාධා රහිත හා ඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම.

ප්‍රාදේශීය සම්බන්ධීකාරක තනතුරු සඳහා සේවා ස්ථාන වනුයේ මාතර හා මන්නාරම වන අතර, තෝරාගත් අයවලුන් අදාළ ප්‍රාදේශීය කාර්යාලවල ස්ථානගත කෙරෙනු ඇත.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මානව හිමිකම් / නීතිය / මානව සම්පත් / කළමනාකරණ / පරිපාලන / රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයක උපාධියක් සමග තනතුරට අදාළ ක්ෂේත්‍රයක, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර එකක පළපුරුද්ද

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 53,175 - 10X1,375 - 15X1,910 - 95,575/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 47,668/- (2019)

පරිපාලන නිලධාරී — JM 1-1

රැකියා ස්වභාවය

ආයතනයේ අරමුණු හා ක්‍රියාකාරකම් ඵලදායී ලෙසට පවත්වාගෙනයාම සඳහා පරිපාලන ඒකකයට සහායවීම හා සම්බන්ධීකරණය කිරීම.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, පරිපාලන / කළමනාකරණ / මානව සම්පත් කළමනාකරණ / රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයක උපාධියක්.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 42,600 - 10X755 - 18X1,135 - 70,580/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 38,185/- (2019)

නඩත්තු නිලධාරී — JM 1-1

රැකියා ස්වභාවය

OMP කාර්යාලයේ සියලුම පරිපාලන හා සේවා සැපයුම් කාර්යයන් සඳහා සහකාර පරිපාලන ප්‍රධානිහට සහාය වෙමින් එම කටයුතු සම්බන්ධීකරණය කිරීම.

සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංජිනේරු / තාක්ෂණ / පහසුකම් කළමනාකරණ ක්ෂේත්‍රයක උපාධියක්.

   හෝ

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   හෝ

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

   හෝ

4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 42,600 - 10X755 - 18X1,135 - 70,580/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 38,185/- (2019)

පර්යේෂණ නිලධාරී — JM 1-1

රැකියා ස්වභාවය

අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ පර්යේෂණ ඒකකයෙහි කාර්යයන් සඳහා සහාය වීම.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය / සමාජීය විද්‍යාව / අපරාධ විද්‍යාව ක්ෂේත්‍රයක උපාධියක්.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 42,600 - 10X755 - 18X1,135 - 70,580/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 38,185/- (2019)

සන්නිවේදන නිලධාරී — JM 1-1

රැකියා ස්වභාවය

අන්තර්ගතය සංවර්ධනය, මාධ්‍ය කටයුතුවලට පහසුකම් සැපයීම, සමාජ මාධ්‍ය වේදිකා ගොඩනැගීම හා අදාළ මාධ්‍ය ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම ඇතුළත්ව OMP කාර්යාලය සඳහා ඵලදායී සන්නිවේදන උපායමාර්ගයක් සංවර්ධනය කොට ක්‍රියාත්මක කිරීම.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජනමාධ්‍ය / ජනසන්නිවේදන උපාධියක්.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 42,600 - 10X755 - 18X1,135 - 70,580/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 38,185/- (2019)

තොරතුරු තාක්ෂණ නිලධාරී — JM 1-1

රැකියා ස්වභාවය

පරිගණක පද්ධති, ජාලකරණ හා වෙනත් අදාළ උපකරණ, අධීක්ෂණය හා පවත්වාගැනීම මගින් සමස්ත ආයතනය තුළ තාක්ෂණ සහාය ලබාදීමේ වගකීම දරයි.

සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තොරතුරු තාක්ෂණ / පරිගණක විද්‍යාව ක්ෂේත්‍රයක උපාධියක්,

   හෝ

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   හෝ

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද,

   හෝ

4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 42,600 - 10X755 - 18X1,135 - 70,580/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 38,185/- (2019)

වින්දිත හා පවුල් සහාය නිලධාරී — JM 1-1

රැකියා ස්ථානය : කොළඹ, මාතර හා මන්නාරම

රැකියා ස්වභාවය

ස්ත්‍රී / පුරුෂභාවයට සංවේදී වූ පරිසරයක් ශක්තිමත් කිරීම හා පවත්වා ගැනීමද ඇතුළත්ව, අතුරුදහන්වූ හා සොයා ගැනීමට නොහැකි තැනැත්තන්ගේ පවුල් සඳහා OMP කාර්යාලය විසින් ලබා දෙනු ලබන සියලුම සහාය හා සේවා ආශ්‍රිතව වින්දිතයන් කේන්ද්‍ර කොටගත් ප්‍රවේශයන් සහතික කරනු පිණිස වන වින්දිත හා පවුල් සහාය ඒකකයේ කොටස්කරුවකු විය යුතුය.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව හිමිකම් / මනෝවිද්‍යාව / උපදේශන හා මනෝ විද්‍යාව / සමාජීය විද්‍යා ක්ෂේත්‍රයක උපාධියක්.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 42,600 - 10X755 - 18X1,135 - 70,580/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 38,185/- (2019)

භාෂා පරිවර්තක — MA 4

රැකියා ස්වභාවය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්යයන්ට අදාළ සියලුම පරිවර්තන කටයුතු ඉටුකළ යුතු අතර, 2016 අංක 14 දරන රාජ්‍ය භාෂා පනතේ අනුකූලව සහාය විය යුතුය.

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, වාග්විද්‍යාව / පරිවර්තන අධ්‍යයන / භාෂා (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) ක්ෂේත්‍රයක උපාධියක්.

දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු වීම.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 37,970 - 10X755 - 15X930 - 5X1,135-65,145/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 34,022/- (2019)

කළමනාකරණ සහකාර — MA 1-1

සේවා ස්ථානය - කොළඹ, මාතර හා මන්නාරම

රැකියා ස්වභාවය

OMP කාර්යාලයේ, කළමනාකරණ, පරිපාලන හා විධායක ශ්‍රේණිවල නිලධාරීන්ගේ රාජකාරී කටයුතුවලට සහායවීම.

සුදුසුකම් :

(අ.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්,

i සිංහල / දෙමළ
ii ඉංග්‍රීසි භාෂාව
iii ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් තුනකින් සමත්ව තිබීම.

වයස : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 27,910-10X300 - 7X350 - 4X495-20X660 - 48,540/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ.)

වැටුප් තලය : රුපියල් 25,018/- (2019)

සභාපතිවරයා / විධායක අධ්‍යක්ෂ සඳහා පුද්ගලික සහායක — MA 1-1

රැකියා ස්වභාවය

සියලුම ලේකම්කරණ කාර්යයන් ඉටුකරමින් සභාපති / විධායක අධ්‍යක්ෂ වෙත සහාය වීම.

සුදුසුකම් :

(අ.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්,
i සිංහල / දෙමළ ii ඉංග්‍රීසි භාෂාව iii ගණිතය

යන විෂයයන් ඇතුළත්ව විෂයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් එක්වරකදී සමත් වීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් තුනකින් සමත්වීම.

මානව සම්පත් කළමනාකරණ / ලේකම්කරණ / පරිපාලන අධ්‍යයන ක්ෂේත්‍රයක ඩිප්ලෝමාවක් සතුවීම, අමතර සුදුසුකමක් වනු ඇත.

වයස : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 27,910-10X300 - 7X350 - 4X495-20X660 - 48,540/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 25,018/- (2019)

රියදුරු — PL 3

සේවා ස්ථානය : කොළඹ, මාතර හා මන්නාරම

රැකියා ස්වභාවය

පවරනු ලබන වාහනය / වාහන පැදවීම කළ යුතු අතර, ඊට අමතරව වාහනවල නඩත්තුව හා ආශ්‍රිත වාර්තා තබා ගැනීම පිළිබඳ රාජකාරී ද ඉටුකළ යුතුය.

සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, අවම වශයෙන් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව, දෙවරකට නොවැඩි වාර ගණනකදී, විෂයයන් හයකින් (06) සමත් වීම සමග මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ බලපත්‍රය ලබා තිබීම හා රියදුරු බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 26,290 - 10X270 - 10X300 - 10X330 - 12X350 - 39,490/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 23,566/- (2019)

කාර්යාල කාර්ය සහායක — PL 1

සේවා ස්ථානය : කොළඹ, මාතර හා මන්නාරම

රැකියා ස්වභාවය

උසස් නිලධාරීන් විසින් පවරනු ලබන කාර්ය ඉටුකිරීම හා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කටයුතු හා ක්‍රියාකාරකම් සඳහා සහාය වීම.

සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සම්මාන සාමාර්ථ 2 ක් සහිතව, දෙවරකට නොවැඩි වාර ගණනකදී, විෂයයන් 6 කින් සමත්වීම.

වයස : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : රුපියල් 24,750 - 10X250 - 10X270 - 7X300 - 15X330 - 37,000/-
(මෙම වැටුප් පරිමාණය, 2020-01-01 දින සිට බලාත්මක වේ)

වැටුප් තලය : රුපියල් 22,186/- (2019)

ඉහත සියලුම තනතුරු සඳහා අදාළ වන කරුණු.

- පරිගණක සාක්ෂරතාවය අමතර සුදුසුකමක් වේ.
- අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම්, සම්පූර්ණ කොට තිබිය යුතුය.
- ඉහත වැටුප්වලට අමතරව, රජය විසින් නියම කරනු ලබන අනෙකුත් දීමනාද, රැකියා වර්ගීකරණයට අනුව ගෙවනු ලැබේ.
- අතුරුදහන්වූ හා සොයාගත නොහැකි තැනැත්තන්ගේ ආසන්නතම ඥාතීන්හට, අදාළ සුදුසුකම් තමන් සතුවේ නම්, ඒ බව සනාථ කිරීමට අවශ්‍ය ලිපි ලේඛන සමග අයදුම්කිරීමට උනන්දු කෙරේ.
- මෙම තනතුරු ස්ථිරවන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකත්වය හිමිවේ.
- දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සමග, ලියාපදිංචි තැපෑලෙන්, සභාපති, අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, ශ්‍රාවස්ති මන්දිරය, අංක 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 යන ලිපිනයට, 2019 අප්‍රේල් 05 වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් බහාඑවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

සභාපති,
අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය,
"ශ්‍රාවස්ති මන්දිරය",
අංක 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

Source: Silumina, Sunday Observer (2019.03.17)